**අරණායක ප්‍රාදේශීය සභාව - 2020**

-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අරණායක ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6 (i)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6 (i)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට යන්ත්‍ර හා උපකරණ වටිනාකම රු.9,660,483 ක් වුවද ගිණුම් ගත වටිනාකම රු.3,466,135 ක් වූයෙන් රු.6,194,348 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව වත්කම් සමීක්ෂණ කමිටුව පත්කර ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ට්‍රම්ට්‍රක් රථයේ, වටිනාකම රු.8,500,000 ක් ලෙස හඳුනාගෙන තිබුණද, රු.6,009,602 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.2,490,398 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වෙනස සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ස්ථාවර තැන්පත් කල් පිරීමේදී ලැබී තිබුණු රු.1,312,013 ක පොලිය නැවත ආයෝජනය කර තිබුණද ගිණුම්ගත කිරීමේදී ආයෝජනය කළ මුදලට එකතු කිරීම වෙනුවට ලැබිය යුතු පොලී ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | අලුත් කිරීමේ නිවේදන නොලැබීම මත මෙසේ සිදුකරන බවත්, අළුත් හිමිකම් සහතික පත්‍ර ලද පසු ආයෝජන ලෙස සටහන් කරන බවත් දන්වා තිබුණි. | ආයෝජන නිවැරදිව ගිණුම්ගත කළ යුතුයි. |
| (ඈ) | 2019 වර්ෂයට අදාලව රු.3,527,984 ක ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂයක් හා මාස 3 ක මුද්දර ගාස්තු උප ලේඛන තවදුරටත් ලැබීමට තිබියදී 2019 වර්ෂයේ මුද්දර ගාස්තු අධි වෙන්කිරීම් ලෙස රු.10,217,620 ක මුදලක් සමුච්චිත අරමුදලට ලියා හැර තිබුණි. | අදාල විෂය නිලධාරීන් ලබා දුන් තොරතුරු අනුව ගිණුම්ගත කර ඇති බවත්, 2021 වර්ෂයේ අදාල තොරතුරු නිවැරදි ආකාරයට ලබාගෙන ගිණුම පිළියෙල කරන බවත් දන්වා තිබුණි. | අධි වෙන්කිරීම් ලියා හැරීමට පෙර ලැබිය යුතු මුද්දර ගාස්තු නිවැරදි වටිනාකම ලබාගත යුතුයි. |
| (ඉ) | 2011 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රදානයකල කොඩිකණු 424 ක වටිනාකම රු. 469,928 ක් ලෙස ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගතකර තිබුණද භෞතික ශේෂයේ වටිනාකම රු. 346,446 ක් වූයෙන් රු. 123,482 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලිපියේ සඳහන් පරිදි වටිනාකම ගිණුම්ගත කළ බව දන්වා තිබුණි. | වෙනසට හේතු සොයා ඌනතාවයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සීසීටීවී කැමරා සවිකිරිමේ වියදම රු. 20,000 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් යන්ත්‍ර උපකරණ ගිණුම හා ප්‍රාග්ධන ගිණුමට ආදායමින් දායකවීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුයි. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 150,696,634 ක් හා උප ලේඛන අනුව වටිනාකම රු. 157,832,514 ක් වූයෙන් රු. 9,702,262 ක වෙනසක් විය. | සේවක ණය, අත්තිකාරම්, හා පුස්තකාල පොත් යන විෂයයන් හි වෙනස සෙවීමට අපහසු බව හා සියළුම ශේෂ පිළිබඳ තවදුරටත් සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වෙනස්කම් හඳුනාගෙන ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේ සිට ඉදිරියට එමින් පැවති රු. 631,350 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය අදාල ගැලපීම් නොකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිරවුල් කිරීමට අවශ්‍ය ලේඛන සභාව සතුව නොමැති බැවින් එය ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අවශ්‍ය තොරතුරු සොයාගෙන නිරවුල් කර ගැනීමට හෝ විධිමත් ක්‍රමවේදයට අනුව කපා හැරීම් සිදුකළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(3) | වර්ෂ 02 ඉක්ම වූ රු.111,707 ක් වටිනා කර්මාන්ත තැන්පතුවක් හා මිශ්‍ර තැන්පත් 13 ක් නිරවුල්කර නොතිබුණි. | මේ සම්බන්ධව විෂය නිලධාරී දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,458,915 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,815,737ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 226,711 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | කුලී | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවල් කුලී හිඟය රු.109,015ක් විය. | විෂය නිලධාරිණියගේ දෝෂයකින් වැඩිපුර මුදලක් ලේඛණගත වී ඇති බැවින් එය කපා හැරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අයවිය යුතු මුදලක් නොමැති බවට තහවුරු කරගෙන කපාහැරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුයි. |
| (ඇ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ වසර 5 ක් ඉක්මවූ උසාවි දඩ මුදල් ශේෂය රු. 50,000 ක් හා මුද්දර ගාස්තු ශේෂය රු. 543,835 ක් විය. | වසර 05 ට වැඩි උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කල්ගත වූ හිඟ ශේෂ නොපමාව අයකර ගත යුතුයි. |

**3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසල බැහැර කිරීම සඳහා සභාව සතුව සුදුසු ඉඩමක් නොවූයෙන් ඒ සඳහා පෞද්ගලික ඉඩමක් ලබාගෙන 2020 වර්ෂය වෙනුවෙන් රු. 840,000 ක මුදලක් ගෙවා තිබුණි. සභා බලප්‍රදේශය තුල දිනකට එකතුවන කසල ටොන් 1-1.5 ත් අතර ප්‍රමාණය මෙම ඉඩමේ වලවල් කපා බැහැර කිරීම පමණක් සිදුකරන අතර සුදුසු ඉඩමක් තෝරාගෙන කසල වලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට හෝ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | වාර්ෂිකව බදු පදනම් මත ලබා ගත් ඉඩමේ කසල කලමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි බවත්, කළුගල ග්‍රාම නිළධාරී වසමේ දෙබත්ගම වත්ත ඉඩම පවරා ගැනීමට කටයුතු සිදුකරන බව දන්වා තිබුණි. | කසල බැහැර කිරීම සම්බන්ධව ස්ථිර විසඳුමකට එළඹිය යුතුයි. |